# Royal College - Colombo 07
# රාජකීය විද්‍යාලය - කොළඹ 07

| 60 | S | I, II |
|---|---|---|

## Grade 11 – Third Term Evaluation –October 2020
## තෙවන වාර පරීක්ෂණය – 2020 –11 ශ්‍රේණිය

අමතර කියවීම් කාලය විනාඩි 10කි

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I/II

කාලය : පැය 2
Time: 2 hours

★ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
★ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
★ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ X ලකුණ යොදන්න.

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

**(1) ප්‍රශ්න අංක 1 සිට 5 දක්වා පිළිතුරු පහත ඡේදය ඇසුරෙන් සපයන්න.**

- ඖෂධවේදී ඩිප්ලෝමාධාරියෙකු වු වංසජ තමාගේ යාළුවෙකුගේ ෆාමසියේ අවුරුදු දෙකක් ඖෂධවේදියෙකු ලෙස කටයුතු කළේය. පසුව ඔහු තමාගේම ෆාමසියක් ඔහු පදිංචි වී සිටින නිවස ආසන්නයේ බෙහෙත් ශාලාවකට සමීපව ''වසංජ ඔසුසල'' නමින් ආරම්භ කරන ලදී.

(1) ඉහත ඡේදයට අනුව වංසජ ඔසුසල ව්‍යාපාරය විසින් සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාවය කුමක් ද?

i) ආහාර ii) ඇඳුම් පැළඳුම් iii) නිවාස iv) සෞඛ්‍යය

(2) ඉහත සඳහන් වංසජ ඔසුසල කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයකට අයත් වේ ද?

i) ඒක පුද්ගල ව්‍යාපාර ii) හවුල් ව්‍යාපාර
iii) සංස්ථාපිත සමාගම් iv) සමිති සංවිධාන

(3) ඉහත ව්‍යාපාරයේ සඳහන් ''ඖෂධ'' කුමන නිෂ්පාදන සාධක ගණයට අයත් වේ ද?

i) භූමිය ii) ශ්‍රමය iii) ප්‍රාග්ධනය iv) ව්‍යවසාය

(4) පහත සඳහන් වාක්‍ය අතුරින් වංසජ ව්‍යාපාරය හා සම්බන්ධ නිවැරදි වාක්‍ය තෝරන්න.

i) ඉහත සඳහන් ව්‍යාපාරයේ ව්‍යාපාර නාමයෙන් ලියාපදිංචි කිරීම අනිවාර්ය නොවේ.
ii) බෙහෙත් ශාලාවක් අසල ෆාමසියක් ආරම්භ කිරීම එම ව්‍යාපාරයට ශක්තියකි.
iii) වංසජ ඔසුසල සේවා සැපයීම ආශ්‍රිත ව්‍යාපාරයකි.
iv) මෙම ව්‍යාපාරය හා ආශ්‍රිතව වංසජ සතු වගකීම සීමිත වේ.

(5) ''වංසජ ඔසුසලට ඖෂධ මිලදී ගැනීම'' කුමන කළමණාකරන කාර්යයට අයත් වේද?

i) සැලසුම්කරණය ii) සංවිධානකරණය
iii) මෙහෙයවීම iv) පාලනය

(6) ..............(1).............. ව්‍යාපාරවල සීඝ්‍ර දියුණුව බලාපොරොත්තු වන අතර ..............(2).............. මුදල් ආපසු ඉක්මනින් ලබා ගැනීම කෙරෙහි උනන්දු වෙති.

ඉහත සඳහන් අංක (1) හා (2) හිස්තැන් පිරවීම සඳහා වඩාත් සුදුසු වචන පහත දී ඇති පිළිතුරු වලින් තෝරන්න.

i) අයිතිකරුවන්, තරඟකරුවන් ii) අයිතිකරුවන්, සැපයුම්කරුවන්
iii) කළමනාකරුවන්, සැපයුම්කරුවන් iv) කළමණාකරුවන්, තරඟකරුවන්

(7) ''කොවිඩ් 19 රෝගය සේවකයින් අතර පැතිරීම හේතුවෙන් ඇඟලුම් කම්හලක් වසා දැමීම'' ව්‍යාපාරයට අයත්,

i) අභ්‍යන්තර පරිසර සාධකයකි. ii) ආර්ථික පරිසර සාධකයකි.

iii) ගෝලීය පරිසර සාධකයකි. iv) ස්වභාවික පරිසර සාධකයකි.

(8) කිසිදු ගිණුමක් නොමැති සවිරු, හුදෙකලා ප්‍රදේශයක ජීවත්වන පුද්ගලයෙකි. සවිරු හට තම විද්‍යුත් කාඩ්පත හා ජංගම දුරකථනය ආශ්‍රයෙන් දුරකථන ගාස්තු ගෙවිය හැක්කේ,

i) හර කාඩ්පත මගිනි. ii) ණය කාඩ්පත මගිනි.

iii) SET කාඩ්පත මගිනි. iv) PET කාඩ්පත මගිනි.

(9) පහත සඳහන් පිළිතුරු ඇසුරෙන් චෙක්පත් හා සම්බන්ධ නිවැරදි පිළිතුරු තෝරන්න.

i) චෙක්පත් රේඛනය කරනුයේ චෙක්පතකට වඩාත් ආරක්ෂාවක් සැලසීමටය.

ii) රේඛනය කරන ලද චෙක්පතක් බැංකු කවුන්ටරය ආශ්‍රයෙන් මුදල් කරගත හැක.

iii) විශේෂ රේඛනයක් සහිත චෙක්පතක් එම චෙක්පත සඳහන් ව ඇති බැංකුවක තැන්පත් කළ යුතුය.

iv) චෙක්පතක් රේඛනය කිරීම මගින් එම චෙක්පතේ සඳහන් මුදල අදාළ පුද්ගලයාට ලැබීමට සැලැස්වීම.

(10) රවිඳු ඔහුගේ සොහොයුරාගේ කුඩා ලොරි රථය තම ව්‍යාපාර කටයුතු වලට යොදා ගන්නා අතර එම රථයට ඔහුගේ නමින් රක්ෂණාවරණයක් සඳහා අයදුම්පත්‍රයක් ඉල්ලුම් කරන ලදී. නමුත් මෙය රක්ෂණ සමාගම විසින් ප්‍රතික්ෂේප කරන ලදී. මෙයට හේතු වූ රක්ෂණ මූලධර්මය වනුයේ,

i) හානිපූර්ණය ii) රක්ෂ්‍ය හිමිකම

iii) උපරිම විශ්වාසය iv) ඉහත සියල්ලම

(11) පහත සඳහන් පිළිතුරු ඇසුරෙන් සන්නිවේදනයේ මූලිකාංග පිළිවෙලින් ඇතුළත් පිළිතුර තෝරන්න.

i) පණිවිඩය, මාධ්‍ය, යවන්නා, ලබන්නා, ප්‍රතිචාරය, ප්‍රතිපෝෂණය.

ii) යවන්නා, මාධ්‍ය, පණිවිඩය, ලබන්නා, ප්‍රතිපෝෂණය, ප්‍රතිචාරය.

iii) යවන්නා, පණිවිඩය, මාධ්‍ය, ලබන්නා, ප්‍රතිචාරය, ප්‍රතිපෝෂණය.

iv) පණිවිඩය, යවන්නා, ලබන්නා, මාධ්‍යය, ප්‍රතිපෝෂණය, ප්‍රතිචාරය.

(12) පහත x හා y තීරුවලින් ප්‍රවාහනයේ මූලිකාංග සහ ඊට අදාළ උදාහරණ දැක්වේ.

| x තීරුව | y තීරුව |
|---|---|
| 1. මාධ්‍යය | A. දක්ෂිණ අධිවේගය |
| 2. මාර්ගය | B. කොළඹ වරාය |
| 3. බලය | C. සුඛෝපභෝගී දුම්රිය |
| 4. පර්යන්තය | D. ඩීසල් |

ඉහත x හා y තීරු ගැලපූ විට වඩාත් සුදුසු පිළිතුර වන්නේ,

i) CABD ii) CADB iii) ACDB iv) BADC

(13) ශ්‍රී ලාංකික කුළුබඩු යුරෝපා රටවලට විකිණීම ..........(1).......... වෙළෙඳාම වන අතර කිලෝ 100 ක හාල් දිනිඳු විසින් මිලදී ගෙන ඇඳිරි නීති ප්‍රදේශ වල ජනතාවට පරිත්‍යාග කිරීම ..........(2).......... වෙළෙඳාම වේ.

ඉහත සඳහන් (1) හා (2) හිස්තැන්වලට අදාළ පිළිතුර වන්නේ,

i) අපනයන, සිල්ලර ii) ආනයන, සිල්ලර

iii) අපනයන, තොග iv) ආනයන, තොග

- **ප්‍රශ්න අංක 14 හා 15 ට පහත ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

ප්‍රමුඛ සුපිරි වෙළඳසැලක කලමණාකාරීත්වය විසින් එම ව්‍යාපාරය පුළුල් කිරීම උදෙසා නව ශාඛා සමූහයක් ග්‍රාමීය දුර බැහැර ප්‍රදේශවල ආරම්භ කිරීමට තීරණය කරන ලදී.

(14) ඉහත සිදුවීම කුමන කලමණාකරණ කාර්යයකට අයත් වේද?

i) සැලසුම්කරණය ii) පාලනය

iii) සංවිධානකරණය iv) මෙහෙයවීම

(15) ඉහත සිදුවීම ඇසුරෙන් පිළිඹිබු වන අලෙවිකරණ විචල්‍ය කුමක් ද?

i) නිෂ්පාදිතය ii) මිල iii) ස්ථානය iv) ප්‍රවර්ධනය

(16) පහත ආයෝජන මාර්ග අතුරින් වැඩිම අවදානම් සහගත ආයෝජනය කුමක් ද?

i) ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම.

ii) දේපළ මිලදී ගැනීම.

iii) භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කිරීම.

iv) කොටස් වල ආයෝජනය කිරීම.

(17) පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක සිදු වු ගනුදෙනුවකි.

රු. 20 000 ක් වටිනා බඩු තොගයක් රු. 25 000 කට මොවිඳුට විකිණීම. මෙම ගනුදෙනුව නිසා ව්‍යාපාරයේ,

i) වත්කම් පමණක් වෙනස් වේ.

ii) හිමිකම් පමණක් වෙනස් වේ.

iii) වත්කම් සහ හිමිකම් පමණක් වෙනස් වේ.

iv) වත්කම්, වගකීම් හා හිමිකම් යන තුනම වෙනස් වේ.

(18) පහත සඳහන් ගනුදෙනු අතුරින් හිමිකම්වලට බලපෑමක් ඇති නොවන ගනුදෙනුව තෝරන්න.

i) රක්ෂණ ගාස්තු සඳහා රු. 6000 ක මුදලක් ගෙවීම.

ii) අමතර ආදායම් ලෙස රු. 1000 ක මුදලක් ලැබීම.

iii) රු. 2000 ක බඩු තොග අයිතිකරු විසින් තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගැනීම.

iv) උපචිත විදුලි ගාස්තු රු. 2000 පියවීම.

(19) පහත දැක්වෙන්නේ ව්‍යාපාරයකට අදාල ද්විත්ව සටහනකි.

| | |
|---|---|
| ණයගැති ගිණුම හර | 15000 |
| විකුණුම් ගිණුම බැර | 15000 |

ඉහත ද්විත්ව සටහනට අදාල ගනුදෙනුව වනුයේ,

i) රු. 15000 ක භාණ්ඩ තොග විකිණීම.

ii) රු. 1500 ක භාණ්ඩ තොග මිලදීගැනීම.

iii) රු. 1500 ක බඩු තොග ණයට විකිණීම.

iv) රු. 1500 ක භාණ්ඩ ණයට ගැනීම.

(20) අභීත්ගේ ව්‍යාපාරයේ 2020. 08.01 දිනට ගිණුම්කරණ සමීකරණය පහත පරිදි විය.

වත්කම් = හිමිකම් + වගකීම්

(රු.) (රු.) (රු.)

70 000 = 50 000 + 20 000

2020. 08.02 දින වන විට ගිණුම්කරණ සමීකරණය පහත දැක්වෙන ආකාරයට දැක්විණි.

වත්කම් = හිමිකම් + වගකීම්

(රු.) (රු.) (රු.)

58 000 = 48 000 + 10 000

2020. 08.02 දින සිදු වූ ගනුදෙනුව කුමක් ද?

i) ණය හිමියන්ට කල ගෙවීම් රු. 12 000, ලද වට්ටම රු. 2000.
ii) ණය ගැතියන්ගෙන් මුදල් ලැබීම් රු. 12 000, දුන් වට්ටම රු. 2000.
iii) පොලී රු. 2 000 ක් ඇතුලුව බැංකු ණය වාරික ගෙවීම් රු. 10 000.
iv) ශක්තිගෙන් ණයට ගත් රු. 12 000 ක් වටිනා භාණ්ඩ තම පෞද්ගලික භාවිතය සඳහා ගැනීම.

- **පහත තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක 21 සහ 22 ට පිළිතුරු සපයන්න.**

| ගනුදෙනුව | | මූලාශ ලේඛන |
|---|---|---|
| 1. මුදලට විකිණුම් | රු. 20 000 | A. විකිණුම් ඉන්වොයිසිය |
| 2. භාණ්ඩ ණයට ගැනුම් | රු. 15 000 | B. ජ'නල් වවුචර් |
| 3. පවන්ට විකුණුම් | රු. 30 000 | C. ලදුපත් |
| 4. ව්‍යාපාරයේ පාවිච්චි කරන ලද රු. 60 000 ක් වටිනා ලී බඩු සේවක සනුජට විකිණීම. | | D. ගැනුම් ඉන්වොයිසිය |

(21) ඉහත සඳහන් ගනුදෙනුවලට අදාළ මූලාශ ලේඛන ගැලපූ විට වඩාත් නිවැරදි පිළිතුර වනුයේ,

i) CDAB ii) ADCB iii) CDBA iv) ABCD

(22) ඉහත ගනුදෙනු සටහන් කිරීම සඳහා භාවිතා වනු ලබන මූලික පොත් අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුරු වනුයේ,

i) විකුණුම් ජ'නලය, ගැනුම් ජ'නලය, මුදල් පොත, පොදු ජ'නලය.
ii) මුදල් පොත, ගැනුම් ජ'නලය, විකුණුම් ජ'නලය, පොදු ජ'නලය.
iii) මුදල් පොත, පොදු ජ'නලය, විකුණුම් ජ'නලය, ගැනුම් ජ'නලය.
iv) මුදල් පොත, ගැනුම් ජ'නලය, පොදු ජ'නලය, විකුණුම් ජ'නලය.

(23) චෙනුල්ගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය රු. 3000 කි. සැප්තැම්බර් මස තුළ එයින් රු. 2950 ක් වියදම් විය. සුළු මුදල් අග්‍රිමය ප්‍රමාණවත් නොවූ බැවින් එය රු. 4000 කට වැඩි කරන ලද අතර සැප්තැම්බර් 30 වන දින ප්‍රතිපූරණය කරන ලදී. ප්‍රතිපූර්ණ කරන ලද අගය කීය ද?

i) රු. 2 950 ii) රු. 3 000 iii) රු. 3 950 iv) රු. 4 000

(24) පහත සඳහන් ගනුදෙනු අතුරින් පොදු ජ'නලයේ සඳහන් නොවන ගනුදෙනුව තෝරන්න.

i) රු. 5000 ක බඩු තොග චේතකට විකිණීම.
ii) භාවිතා කරන ලද මෝටර් රථයක් සැපයුම්කරු දිනුරට රු. 400, 000 ක මුදලට විකිණීම.
iii) රු. 8000 ක බඩු තොග අයිතිකරු විසින් සිය පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගැනීම.
iv) රු. 10,000 ක් වටිනා යන්ත්‍රයක් ඉන්කා වෙළඳ සමාගමෙන් මිලට ගැනීම.

- **පහත තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක 25 ට සහ 26 ට පිළිතුරු සපයන්න.**

2020 සැප්තැම්බර් 30 දිනට බැංකු ගිණුමේ ශේෂය රු. 16 300 කි. එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය වෙනත් අගයක් දක්නට ලැබුණි. ඒ සඳහා පහත කරුණු හේතු විය.

A නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොකල චෙක්පත් - රු. 3200.
B සෘජු ප්‍රේෂණ - රු. 4 000
C ස්ථාවර නියෝග වශයෙන් කළ රක්ෂණ ගාස්තු ගෙවීම් - රු. 5200.

(25) ඉහත තොරතුරු ඇසුරෙන් බැංකු ගිණුමේ ශේෂය බැංකු ප්‍රකාශනයේ ශේෂයට වඩා වැඩියෙන් පැවතීමට හේතු කවරේ ද?
i) A පමණි. ii) C පමණි. iii) A හා C පමණි. iv) B හා C පමණි.

(26) 2020 සැප්තැම්බර් 30 දිනට සංශෝධිත බැංකු ගිණුමේ ශේෂය,
i) රු. 5 100 කි. ii) රු. 15 100 කි. iii) රු. 20 300 කි. iv) රු. 18 300 කි.

(27) ''චෙක්පත් ආශ්‍රයෙන් රක්ෂණ ගාස්තු ගෙවීම'' සඳහන් විය යුත්තේ කවර මූලික පොතෙහි ද?
i) ගෙවීම් වවුචර ii) ලදුපත
iii) මුදල් ගිණුම iv) බැංකු ගිණුම

(28) ණයගැතියෙකුගෙන් ලද රු. 15 000 ක චෙක්පත අගරු විය. මෙමගින් ව්‍යාපාරයේ,
i) බැංකු ශේෂය අඩු වී ණයගැති ශේෂයද අඩු වේ.
ii) බැංකු ශේෂය අඩු වී ණයගැති ශේෂය වැඩි වේ.
iii) බැංකු ශේෂය වැඩි වී ණයගැති ශේෂයද අඩු වේ.
iv) බැංකු ශේෂය වැඩි වී ණයගැති ශේෂයද වැඩි වේ.

- **ප්‍රශ්න අංක 29 හා 30 සඳහා පිළිතුරු පහත තොරතුරු ඇසුරෙන් සපයන්න.**

ව්‍යාපාරයක් විසින් භාතියගෙන් රු. 3 500 කට ණයට මිලදී ගත් බඩු තොග භාතියගේ ගිණුමේ රු. 53 000 ක් ලෙස සටහන් විය.

(29) මෙම ගිණුම්කරණ දෝෂය හේතුවෙන්,
i) ශේෂ පිරික්සුමේ හර පැත්ත රු. 18 000 කින් අඩු විය.
ii) ශේෂ පිරික්සුමේ හර පැත්ත රු. 18 000 කින් වැඩි විය.
iii) ශේෂ පිරික්සුමේ බැර පැත්ත රු. 18 000 කින් අඩු විය.
iv) ශේෂ පිරික්සුමේ බැර පැත්ත රු. 18 000 කින් වැඩි විය.

(30) ඉහත සඳහන් ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීම සඳහා අදාළ වන ජ්නල් සටහන වනුයේ,

i) ගැනුම් ගිණුම හර රු. 8 000
 අවිනිශ්චිත ගිණුම බැර රු. 8 000

ii) ගැනුම් ගිණුම හර රු. 18 000
 ණය හිමි ගිණුම බැර රු. 18 000

iii) ණය හිමි ගිණුම හර රු. 18 000
 අවිනිශ්චිත ගිණුම බැර රු. 18 000

iv) අවිනිශ්චිත ගිණුම හර රු. 18 000
 ණය හිමි ගිණුම බැර රු. 18 000

(31) රන්තරු ක්‍රීඩා සමාජයේ පහත ගනුදෙනු වලින් ආදායම් ප්‍රකාශයේ සඳහන් නොවනු ලබන ගනුදෙනුව වනුයේ,

i) වර්ෂය තුළදී ලැබූ සාමාජික මුදල රු. 32 000 කි.

ii) ලැබිය යුතු සාමාජික මුදල රු. 5 000 කි.

iii) සාමාජිකයන්ගෙන් වර්ෂයට අදාල සාමාජික මුදල රු. 48 000 කි.

iv) කලින් ලද සාමාජික මුදල් රු. 8 000 කි.

(32) සිතුමිණිගේ ව්‍යාපාරය විසින් 2019 ජනවාරි 01 දින මාසික කුලිය රු. 8 000 ක ගොඩනැගිල්ලක් ලබා ගන්නා ලදී. 2019. 12. 31 දිනට රු. 80 000 ක ගොඩනැගිලි කුලී ගෙවා තිබේ. මෙම ව්‍යාපාරයේ 2019. 12. 31 දිනට,

i) ලාභාලාභ ගිණුමේ ගොඩනැගිලි කුලී වියදම් රු. 80 000 කි.

ii) ලාභාලාභ ගිණුමේ ගොඩනැගිලි කුලී වියදම් රු. 8 000 කි.

iii) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ උපචිත ගොඩනැගිලි කුලී වියදම් රු. 16 000 කි.

iv) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ උපචිත ගොඩනැගිලි කුලී වියදම් රු. 8 000 කි.

- **ප්‍රශ්න අංක 33 සිට 38 දක්වා පහත තොරතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

පහත දැක්වෙන්නේ මෙඩාන්ගේ ව්‍යාපාරයේ 2019. 12. 31 දිනට අදාල ශේෂයන් කිහිපයකි.

| | රු. |
|---|---|
| 2019. 01. 01 දිනට ප්‍රාග්ධනය | 400 000 |
| 2019. 01. 01 දිනට තොගය | 18 000 |
| ගැනුම් | 340 000 |
| විකුණුම් | 680 000 |
| 15% බැංකු ණය | 100 000 |
| ප්‍රචාරණ වියදම් | 4 000 |
| බෙදාහැරීමේ රථ (පිරිවැය මත) | 500 000 |
| යන්ත්‍ර (පිරිවැය මත) | 60 000 |
| රක්ෂණ ගාස්තු | 8 000 |
| බැංකු ණය පොලී | 10 000 |
| 2019. 01. 01 දිනට ක්ෂය වෙන් කිරීම | |
| බෙදාහැරීමේ රථ | 100 000 |
| යන්ත්‍ර | 6 000 |
| ණයගැතියෝ | 24 000 |
| ණයහිමියෝ | 34 000 |

අමතර තොරතුරු,

- 2019. 12. 31 දිනට තොගය රු. 16 000 කි.
- ණය ගැතියන්ගෙන් රු. 2 000 ක් බොල් ණය ලෙස කපා හැරීමට තීරණය කරන ලදී.
- බෙදා හැරීමේ රථ හා යන්ත්‍ර වාර්ෂිකව 10% ක් පිරිවැය මත ක්ෂය කල යුතුය.

(33) 2019.12.31 න් අවසන් වර්ෂය සඳහා දළ ලාභය,

i) රු. 328 000 ii) රු. 342 000

iii) රු. 338 000 iv) රු. 383 000

(34) 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ ගිණුමේ සඳහන් වන බෙදා හැරීමේ වියදම් වල මුළු එකතුව,

i) රු. 52 000 ii) රු. 54 000

iii) රු. 56 000 iv) රු. 58 000

(35) 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදලින් ගෙවන ලද බැංකු ණය පොලී ප්‍රමාණය,

i) රු. 10 000 ii) රු. 5 000

iii) රු. 15 000 iv) රු. 10 000

(36) 2019.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශයේ සඳහන් විය යුතු මුළු සමුච්චිත ක්ෂය ප්‍රමාණය,

i) රු. 106,000 ii) රු. 162,000

iii) රු. 150,000 iv) රු. 126,00

(37) මෙම ව්‍යාපාරයේ ශුද්ධ ලාභය වනුයේ,

i) රු. 235 000 ii) රු. 253 000

iii) රු. 223 000 iv) රු. 281 000

(38) 2019.12.31 දිනට මෙම ව්‍යාපාරයේ හිමිකම,

i) රු. 635 000 ii) රු. 623 000

iii) රු. 653 000 iv) රු. 681 000

- **ප්‍රශ්න අංක 39 හා 40 ට පහත තොරතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

සංකේත් පාසල් බෑග් නිෂ්පාදනය කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් කුලියට ගත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යයි. ඔහු සතියකට බෑග් 20 ක් නිෂ්පාදනය කරයි. ඒ සඳහා දරන ලද වියදම් පහත සඳහන් වේ.

| | රු. |
|---|---|
| රෙදි නූල් සහ අනෙකුත් අමුද්‍රව්‍ය | 15 000 |
| බෑග් සාදන්නාගේ සතියක වැටුප | 4 000 |
| සතියක ගොඩනැගිලි කුලිය | 500 |
| සතියක විදුලි බිල | 250 |
| ඇසුරුම් සඳහා | 250 |

(39) මෙම ව්‍යාපාරයේ බෑග් සාදන්නාට ගෙවන ලද වැටුප්,

i) වක්‍ර ශ්‍රමය ii) ඍජු වෙනත්

iii) ප්‍රාථමික පිරිවැය iv) පොදු කාර්ය පිරිවැය

(40) බෑගයක් රු. 1200 කට විකිණෙන්නේ නම් සංකේත් විසින් ලබන ලාභාංශය කොපමණ ද?

i) 5% ii) 10% iii) 15% iv) 20%

**රාජකීය විද්‍යාලය - කොළඹ 07**

**11 ශ්‍රේණිය**

**අවසාන වාර ඇගයීම – 2020**

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II**

| 60 | S | I, II |
|---|---|---|

- වැදගත් : උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු, අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථාවල දී ලකුණු නොකරම කපා හරිනු ලැබේ.

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව **I** කොටසින් ප්‍රශ්න දෙකක් ද, **II** කොටසින් ප්‍රශ්න දෙකක් ද, බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න

- පිළිතුරු පැහැදිලි අත්අකුරින් ලියන්න.

**I කොටස - ව්‍යාපාර අධ්‍යයනය**

(1) පහත දැක්වෙන සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

Covid – 19 වසංගතය හේතුවෙන් නිවෙස් වලට සීමා වී සිටි මිනිසුන් තම නිවෙස් වල අවශ්‍යතාවයන් සපුරාලීම උදෙසා ගෙවතු වගාවල නිරත වන්නට විය.
කෘෂි විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකු වූ ඉෂාර රැකියාවක් බලාපොරොත්තුවෙන් සිටි අතර ඔහු තම කාලය නවීන තාක්ෂණය යොදා ගනිමින් නව කෘෂි නිෂ්පාදිත පිළිබඳ පර්යේෂණ වල නියැලෙමින් සිටී. එහි ප්‍රතිඵලයක් ලෙස ස්ට්‍රෝබෙරි වගාව සඳහා හයිඩ්‍රොපොනික තාක්ෂණ (Hydroponic) ක්‍රමය භාවිතා කරන ලදී. මෙම වගාව සඳහා අක්කර 2 ක භූමියක් දඹුල්ල ප්‍රදේශයෙන් වෙන් කර ඇති අතර, ඒ සඳහා P.V.C බට හා නල ජලය භාවිතා කරමින් හරිත නිවාස 5 ක් තුළ නල වගා ඒකක නිර්මාණය කරන ලදී.
ඔහුගේ ව්‍යාපාරය ''දඹුලු හයිඩ්‍රොපොනික ස්ට්‍රෝබෙරි ගොවිපළ'' යනුවෙන් නම් කරන ලදී. ජෑම් නිෂ්පාදන සමාගම් 3 කින් ඇණවුම් ලැබී ඇති අතර ප්‍රධාන සුපිරි වෙළඳ සැලකින් ස්ට්‍රෝබෙරි පැකට් සඳහා ද ඇණවුමක් ලැබී ඇත. දඹුලු හයිඩ්‍රොපොනික ස්ට්‍රෝබෙරි ගොවිපළේ 2020. 10. 01 දිනට පැවති ශේෂයන් මෙසේය.

| | රු. |
|---|---|
| මුදල් ශේෂය | 138 000 |
| නිවාස හා හයිඩ්‍රොපොනික ඒකක | 280 000 |
| අනෙකුත් උපකරණ | 30 000 |
| 2020. 10. 01 දිනට තොගය | 60 000 |
| ණයහිමියෝ | 40 000 |
| බැංකු ණය | 75 000 |

පහත දැක්වෙන ගනුදෙනු 2020 ඔක්තෝබර් මාසය තුළදී සිදු විය.

| | රු. |
|---|---|
| පොහොර සඳහා | 30 000 |
| සේවක වැටුප | 44 000 |
| ණයට විකුණුම් | 100 000 |
| අත්පිට විකුණුම් | 150 000 |
| ගෙන යාමේ කුලී | 12 000 |
| විදුලි ගාස්තු | 6 000 |
| මාස 6 ක කුලී (ඉඩම සඳහා) | 60 000 |
| ණයහිමියන්ට කල ගෙවීම් | 28 000 |

උපචිත දුරකතන ගාස්තු 1 500

ඉෂාරගේ වෙබ් අඩවියට පිවිසි විදේශීය ගැණුම්කරුවෙකු විද්‍යුත් තැපැල හරහා ඇණවුමක් යොමු කර ඇත. දිවයින පුරා විසිරී සිටින පළතුරු සැපයුම්කරුවන්ගෙන් පළතුරු ලබා ගෙන ඔහුගේම ජෑම් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීමට බලාපොරොත්තුවෙන් සිටී. එසේම ඔහු විසින් මහජන බැංකුවෙන් රු. 200 000 ක ණය මුදලක් ලබා ගැනීමට ද අයදුම් කර ඇත.

i) අ) දඹුලු හයිඩ්‍රොපොනික ස්ට්‍රෝබෙරි ගොවිපළ අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?
   ආ) විකිණීම සඳහා තබා ඇති ස්ට්‍රෝබෙරි පැළ අයත් වන නිෂ්පාදන සාධකය කුමක්ද?

ii) අ) දඹුලු හයිඩ්‍රොපොනික ස්ට්‍රෝබෙරි ගොවිපළ ලියාපදිංචි කල යුතුද?
   ආ) ඉහත (ii) අ) පිළිතුරට අදාල හේතුව පහදන්න.

iii) අ) ඉහත සිද්ධි ඇසුරෙන් ව්‍යාපාරයේ දැකිය හැකි ශක්තියක් හා ව්‍යාපාර අවස්ථාවක් ලියා දක්වන්න.
   ආ) මෙම ව්‍යාපාරයට සම්බන්ධ ඇල්මැති පාර්ශ්ව 2ක් නම් කරන්න.

iv) ඉහත සිද්ධිය ඇසුරෙන් සැලසුම්කරණය හා සංවිධානකරණයට අදාල උදාහරණය බැගින් සපයන්න.

v) 2020. 10. 01 දිනට ගිණුම්කරණ සමීකරණය ලියා දක්වන්න.

vi) අ) මෙම ව්‍යාපාරයට සම්බන්ධ මූලික පොත් 2ක් නම් කර ඊට අදාල මූලාශ්‍ර ලේඛන 2ක් නම් කරන්න.
   ආ) 2020 ඔක්තෝබර් මසට අදාල මුළු විකුණුම් ආදායම කොපමණද?

vii) රු. 1500 උපචිත දුරකතන ගාස්තුවට අදාල ද්විත්ව සටහන ලියන්න.

viii) 2020.10.31 දිනට මුදල් ශේෂය කොපමණ ද?

ix) 2020.10.31 දිනට ව්‍යාපාරයේ ලාභය හෝ අලාභය ගණනය කරන්න.

x) දඹුලු හයිඩ්‍රොපොනික ස්ට්‍රෝබෙරි ව්‍යාපාරයේ 2020.10.31 දිනට මුළු හිමිකම හා වගකීම්වල වටිනාකම් වෙන වෙනම ලියා දක්වන්න.

2) i) අ) ව්‍යාපාරයක් යනු කුමක්ද?
   ආ) ව්‍යාපාරයක දැකිය හැකි පොදු අරමුණු 2 ක් ලියන්න.

ii) පහත දැක්වෙන ප්‍රකාශන අතුරෙන් නිවැරදි ප්‍රකාශවලට සත්‍ය ද වැරදි ප්‍රකාශවලට අසත්‍ය ද යන්න දක්වන්න.
   අ) මිනිස් වුවමනා සපුරාලීමට ව්‍යාපාරකයින් විසින් විවිධ වූ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරයි.
   ආ) තරඟකරුවන් ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර සාධකවලට අයත් වේ.
   ඇ) ව්‍යාපාරයක කළමනාකරු කායික ශ්‍රමය යන නිෂ්පාදන සාධකයකට නිදසුනකි
   ඈ) නීත්‍යානුකුල කටයුතුවල දී දෙපාර්තුමේන්තු ප්‍රධානියා එම කටයුතුවලට තම නිල නාමයෙන් පෙනී සිටිය යුතුය.

iii) කිරිබත්ගොඩ ප්‍රදේශයේ වෙසෙන අරුණ, ශාන්තගේ උදව් ඇතුව පිත්තල නිෂ්පාදිත නිෂ්පාදනය කර හාර්ඩ්වෙයාර්වලට විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. මෙම නිෂ්පාදිත අරුනගේ ව්‍යාපාර වෙතට පැමිණෙන ගනුදෙනුකරුවන් හට ද විකිණනු ලැබේ.
   අ) ඉහත සිද්ධිය ඇසුරෙන් අරුණගේ ව්‍යාපාරයට අදාළ සේවකයන් හා ගනුදෙනුකරුවන සඳහා නිදසුන බැගින් දක්වන්න.
   ආ) ඉහත (iii) (අ) කොටසේ සඳහන් කළ ඇල්මැති පාර්ශවයන් අරුණගේ ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දැක්වීම සඳහා ඇති හේතු පහදන්න.

iv) අ) ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර සුදුසු ව්‍යාපාර සංවිධාන වර්ගයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු මොනවාද?
   ආ) නීතිමය පුද්ගලභාවයක් සහිත ව්‍යාපාර සංවිධාන 2ක් සඳහන් කරන්න.

3) i) අ) චෙක්පතක් යනු කුමක්ද?

ආ) සුදුසු සන්නිවේදන මාධ්‍යයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු 2 ක් සඳහන් කරන්න.

ii) පහත ප්‍රකාශන අතුරින් නිවැරදි ප්‍රකාශනවලට සත්‍ය ද වැරදි ප්‍රකාශ වලට අසත්‍ය ද ලෙස දක්වන්න.

අ) ස්ථාවර තැන්පතුවක තැන්පත් කර ඇති මුදලක් හදිසි අවශ්‍යතාවයක දී කල් ඉකුත් වීමේ දිනයට පෙර ආපසු ලබා ගැනීමට නොහැක.

ආ) චෙක්පතක් පිටසන් කිරීම යනු චෙක්පතක් මුහුණත හරහා සමාන්තර රේඛා 2 ක් හරහට ඇඳීමය.

ඇ) රක්ෂකයෙකු ඔහුගේ ජීවිත රක්ෂණයට අදාළ ගිවිසුම අවසන් වීමට පෙර මිය ගියහොත් ඔහුගේ පවුලේ සාමාජිකයින්ට වන්දියක් ලෙස ඔහු ජීවිත රක්ෂණය සඳහා ආයෝජනය කළ මුදල ආපසු ලබා ගත හැක.

ඈ) සෑම ගමනාන්තයකටම ලඟා වීමට නොහැකි වීම ජල මාර්ග ප්‍රවාහනයේ අවාසියකි.

iii) මාර්ග තදබදය හා සම්බන්ධ නීති රීති පැනවනු ලැබුවේ නීති වර්ග 2ක් අනුවය. පළමුව වම්පසින් ගමන් කිරීමට අදාළ නීතිය වන අතර දෙවනුව වූයේ බස් ප්‍රමුඛතා මංතීරු නීතියයි, යනුවෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (D.I.G) රථ වාහන කාර්යාංශ ප්‍රවෘත්ති නිවේදනයකින් දැනුම් දුන්නේ ය.

අ) ඉහත සඳහන් සිද්ධිය ඇසුරෙන් සෘජුවම කියවෙන ප්‍රවාහන මූලිකාංග සඳහන් කරන්න.

ආ) සන්නිවේදනයට අදාළ මූලිකාංග 2ක් ඉහත සිද්ධිය ඇසුරෙන් දක්වන්න.

iv) සතිර විසින් තම ව්‍යාපාරයේ පාවිච්චිය සඳහා මිල දී ගත් මෝටර් රථය වෙනුවෙන් HNB රක්ෂණ සමාගම PLC වෙතින් රක්ෂණාවරණයක් ලබා ගන්නා ලදි.

අ) ඉහත සිද්ධිය ඇසුරෙන් රක්ෂිතයා හා රක්ෂකයා වෙන වෙනම දක්වන්න.

ආ) දේපළ රක්ෂණය හා ජීවිත රක්ෂණය ( ආරක්ෂණය) අතර වෙනස්කමක් ලියන්න.

4) i) අ) කොටසක් යනු කුමක්ද?

ආ) සුදුසු ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේ දී සැලකිය යුතු තරුණු 2 ක් සඳහන් කරන්න.

ii) පහත ප්‍රකාශන අතුරින් නිවැරදි ප්‍රකාශන වලට සත්‍ය ලෙස ද, වැරදි ප්‍රකාශනවලට අසත්‍ය ද ලෙස ද දක්වන්න.

අ) මෙහෙයවීම යනු ව්‍යාපාර කටයුතු සඳහා කළමනාකරුවන් පත් කිරීම හා සම්බන්ධ ක්‍රියාවලියකි

ආ) අවශ්‍ය සම්පත් ලබා ගන්නා ආකාරය තීරණය කිරීම සැළසුම්කරණය හා සම්බන්ධ කාර්යයකි.

ඇ) නව ගනුදෙනුකරුවන් ව්‍යාපාරය වෙතට ආකර්ෂණය කර ගැනීම අලෙවිකරණය සම්බන්ධ වේ.

ඉ) ප්‍රචාරණ දැන්වීම් පල කිරීම නිෂ්පාදිත ප්‍රවර්ධනය සඳහා භාවිතා කරන එක් උපක්‍රමයකි.

iii) හෙල අරණ නිෂ්පාදිත ව්‍යාපාරය විසින් ඖෂධීය පැලෑටි භාවිතා කරමින් සම ආරක්ෂා කෙරෙන ආකාරයෙන් විෂබීජ නාශක දියරයක් (sanitizer) වෙළඳපොළට හඳුන්වා දෙන ලදි. මෙම කාර්ය සාර්ථක කර ගැනීම සඳහා රූපවාහිනි හා සමාජ මාධ්‍ය ඔස්සේ නිෂ්පාදිත එලි දැක්වීමේ වැඩ සටහනක් පැවැත්විණි. විෂබීජ නාශක දියර බෝතල් 2 බැගින් මිලදී ගන්නා පාරිභෝකියින් හට 20% ක වට්ටමක් ලබාදෙන ලදී. එසේම දිවයින පුරා බෙදා හැරීම සඳහා පාවිච්චි කරන ලද කුඩා වෑන් රථ 2ක් යොදා ගන්නා ලදි.

ඉහත සිද්ධිය ඇසුරෙන් අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් නම් කර ඊට අදාල උදාහරණ දක්වන්න.

| | අලෙවිකරණ මිශ්‍රය | සිද්ධියට අදාල උදාහරණය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

iv) අ) සාමාන්‍ය කොටස්වල ආයෝජනවෙන් ලැබෙන ප්‍රතිලාභ 2ක් නම් කරන්න.

ආ) කොළඹ කොටස් වෙළඳපොළ කටයුතු විධිමත්ව පවත්වා ගෙනයාම හා අධීක්ෂණය කිරීම සඳහා රජය විසින් පත් කර ඇති ආයතනය කුමක්ද?

## II කොටස - ගිණුම්කරණය

5) i) අ) ගනුදෙනුවක් යනු කුමක්ද?

ආ) ව්‍යාපාරයක හිමිකම් වෙනස්වන සාධක 2 ක් නම් කරන්න

ii) පහත දැක්වෙන ගනුදෙනුවට අදාල ද්විත්ව සටහන් ලියා දක්වන්න.

අ) අයිතිකරු විසින් සිදු කර ඇති භාණ්ඩ ගැනිලි රුඃ 5000 කි.

ආ) රු. 50 000 ක් වටිනා විදුලි උපකරණ ව්‍යාපාර පාවිච්චිය සඳහා AK ට්‍රේඩින් සමාගමෙන් මිල දී ගැනීම.

iii) පහත දැක්වෙන්නේ 2020.01.01 දිනට පැවති වත්කම් වගකීම් හා හිමිකම් ගිණුම්වල ශේෂයන් ය. 2020 ජනවාරි මාසයේ පළමු සතිය තුළ සිදු වූ ගනුදෙනුවලට සිදු වූ බලපෑම් ගිණුම් සමීකරණ පහත පරිදි දක්වා ඇත.

| | වත්කම් | | හිමිකම් | | වගකීම් |
|---|---|---|---|---|---|
| | රුඃ | | රුඃ | | රුඃ |
| 2020.01.01 ශේෂය | 300 000 | = | 225 000 | + | 75 000 |
| 1) | බඩු තොග + 30 000 | = | | | ණයහිමියෝ +30 000 |
| 2) | මුදල් + 75 000 | = | ප්‍රාග්ධන + 75 000 | | |
| 3) | මුදල් − 9 000 | = | කුලිය − 9 000 | | |
| 4) | තොග − 12 000 | = | ලාභය | | |
| | ණයගැති + 15 000 | | + 3000 | | |

අවශ්‍ය වන්නේ,

අ) ඉහත සඳහන් සමීකරණයට අදාල ගනුදෙනු වටිනාකම් සහිතව ලියා දක්වන්න

ආ) සතිය අවසානයේ පැවති ශේෂයන් ලියා දක්වන්න.

iv) පහත දැක්වෙන්නේ තිසල් විසින් පවත්වා ගෙන යනු ලබන රෙදි පිළි අලෙවි කිරීමේ ව්‍යාපාරයක 2020 ජූනි මාසයට අදාල තොරතුරුය.

| | |
|---|---|
| 2020.06.04 | එකක් රු 500 බැගින් කමිස 20 ක් ඔවින්ගෙන් ණයට ගැනීම (ඉන්වොයිස් අංක 732) 5% වට්ටමක් දෙන ලදි. |
| 2020.06.06 | පහත සඳහන් ගනුදෙනු අත්පිට මුදලට සිදු කරන ලදී.<br>ගවුම් 15 ක් එකක් රු. 375 බැගින් (වවුචර් අංක 123)<br>කොට කලිසම් 25 ක් එකක් රු. 175 බැගින් (වවුචර් අංක 123) |
| 2020.06 10 | ගමගේ ලී බඩු ආයතනයෙන් වානේ අල්මාරියක් රු. 15 000 කට ගැනීම |
| 2020.06.15 | ඩෙනිම් කලිසම් 15 ක් නිමන්තගෙන් රු 600 බැගින් මිලදී ගැනීම |

අවශ්‍ය වන්නේ,

අ) ජූනි මාසය තිසල්ගේ ව්‍යාපාරයේ ගැණුම් ජ'නලය පිළියෙල කරන්න.

ආ) 2020.06.30 දිනට ගනුදෙනු ලෙජරයට පිටපත් කරන්න.

6) i) අ) මූලික පොත් යනු කුමක්ද?

ආ) නිකුත් කළ චෙක්පතක් අගරුවීමට අදාල ද්විත්ව සටහන ලියා දක්වන්න.

ii) පහත දැක්වෙන්නේ නිදුලගේ ව්‍යාපාරයේ බෝනික්කන් නිෂ්පාදනය කිරීමේ ආයතනයේ සැප්තැම්බර් මාසයට අදාල තොරතුරු

| | රු. |
|---|---|
| කපු රෙදිවල පිරිවැය | 8000 |
| සෘජු වෙනත් වියදම් | 2000 |
| විදුලි ගාස්තු | 1000 |
| වක්‍ර ද්‍රව්‍ය | 2000 |
| වක්‍ර වෙනත් වියදම් | 3000 |

අ) අදාල මාසය තුළ ඒකක 100 ක් නිපදවා ඇති අතර ඒකකයක පිරිවැය රුː 200 ක් නම් සෘජු ශ්‍රම පිරිවැය කොපමණ ද?

ආ) ලාභාංශ 20% ක් නම් බෝනික්කෙකුගේ විකුණුම් මිල කීය ද?

iii) තිසුකගේ ව්‍යාපාරයේ 2020 සැප්තැම්බර් 30 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම අසමාන වූ හෙයින් එහි වෙනස වූ රුː 3000 අවිනිශ්චිත ගිණුමේ හරට සටහන් කරන ලදී. පසුව පහත දැක්වෙන වැරදි අනාවරණය විය.

A) රුː 9 300 විකුණුම් ඉන්වොයිසියක් පිළිබඳ කිසිදු සටහනක් සටහන් වී නොමැත.

B) රුː 54 000 ක වැටුප් ගෙවීම් වැටුප් ගිණුමේ රුː 45 000 ක් ලෙස සටහන් වීම.

C) මෝටර් රථ අළුත්වැඩියා වියදම වූ රුː 17 000 ක මුදල මෝටර් රථ ගිණුමට හර කර ඇත.

D) රුː 6 000 ලැබූ ගෙවල් කුලී ආදායම මුදල් පොතේ පමණක් සටහන් වීම.

අවශ්‍ය වන්නේ

අ) ඉහත සඳහන් වැරදි අතුරෙන් ශේෂ පිරික්සුම අසමානවීමට බලපාන වැරදි තෝරා නම් කරන්න.

ආ) ඉහත සඳහන් දෝෂ පොදු ජ'නලයක ලියා දක්වන්න.

ඉ) අවිනිශ්චිත ගිණුමද පිළියෙල කරන්න.

iv) රනුජගේ ව්‍යාපාරයට අදාල 2020 ජුනි මාසයට අදාල බැංකු ගිණුම හා බැංකුවෙන් එවන ලද බැංකු ප්‍රකාශනය පහත දක්වේ.

බැංකු ගිණුම

| දිනය | විස්තරය | ස/පි | වටිනාකම රුː | දිනය | විස්තරය | ස/පි | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| 2020/07/01 | ශේෂය ඉ/ගෙ | | 18 000 | 2020/07/06 | ණයහිමියෝ 15343 | | 12 000 |
| 2020/07/05 | මුදල් තැන්පතු | | 6 000 | 2020/07/18 | රක්ෂණ 15344 | | 6 000 |
| 2020/07/12 | චෙක් තැන්පතු | | 12 000 | 2020/07/23 | ණයහිමි 15345 | | 14 000 |
| 2020/07/15 | චෙක් තැන්පතු | | 5 000 | 2020/07/31 | ශේෂය ඉ/ගෙ | | 31 000 |
| 2020/07/21 | මුදල් තැන්පතු | | 9 000 | | | | |
| 2020/07/28 | චෙක් තැන්පතු | | 13 000 | | | | |
| | | | 63 000 | | | | 63 000 |
| 2020/08/01 | ශේෂය ඉ/ගෙ | | 31 000 | | | | |

බැංකු ප්‍රකාශනය

| දිනය | විස්තරය | හර රු: | බැර රු: | ශේෂය රු: |
|---|---|---|---|---|
| 2020/07/01 | ශේෂය ඉ/ගෙ | | | 18 000 |
| 2020/07/05 | මුදල් | | 6 000 | 24 000 |
| 2020/07/07 | චෙක්පත් ගෙවීම් - 15343 | 12 000 | | 12 000 |
| 2020/07/15 | චෙක්පත් තැන්පතු | | 12 000 | 24 000 |
| 2020/07/16 | චෙක්පත් තැන්පතු | | 5 000 | 29 000 |
| 2020/07/18 | ණයගැති ප්‍රේෂණ | | 13 000 | 42 000 |
| 2020/07/20 | මුදල් තැන්පතු | | 9 000 | 51 000 |
| 2020/07/22 | චෙක්පත් ගෙවීම් - 15344 | 6 000 | | 45 000 |
| 2020/07/25 | ස්ථාවර නියෝග (බැංකු ණය වාරික) | 18 000 | | 27 000 |
| 2020/07/31 | බැංකු ගාස්තු | 2 000 | | 25 000 |

අවශ්‍ය වන්නේ,

අ) 2020 ජූලි 31 දිනට සංශෝධිත බැංකු ගිණුම

ආ) 2020 ජූලි 31 දිනෙන් අවසන් මාසයට අදාල බැංකු සැසඳුම් විස්තරය.

7) i) අ) උපචිත පදනම යනු කුමක් ද?

ආ) වාර්ෂික ක්ෂය ප්‍රමාණය ගණනය කිරීම සඳහා අදාල වන සාධක 2ක් ලියා දක්වන්න.

ii) 2019 වර්ෂයේ ගෝල්ඩ් ස්ටාර් ක්‍රීඩා සමිතියේ සාමාජික සංඛ්‍යාව 50 කි. වාර්ෂික සාමාජික ගාස්තුව රු: 1000 කි. 2019 වර්ෂයේ ලැබීම් හා ගෙවීම් ගිණුම පහත දැක්වේ.

ලැබීම් හා ගෙවීම් ගිණුම

| | රු: | | රු: |
|---|---|---|---|
| 2019.01.01 ශේෂය ඉ/ගෙ | 38 000 | ක්‍රීඩා උපකරණ මිලට ගැනීම | 28 000 |
| සාමාජික මුදල් | 42 000 | ක්‍රීඩා පිටි නඩත්තු වියදම් | 3 000 |
| පුහුණුකරුවන්ගෙන් ලැබීම් | 20 000 | පුහුණුකරුවන්ට ගෙවීම් | 10 000 |
| | | මුරකරුගේ වැටුප | 12 000 |
| | | විදුලි ගාස්තු | 2 000 |
| | | ශේෂය ප/ගෙ | 45 000 |
| | 100 000 | | 100 000 |
| ශේෂය ඉ/ගෙ | 45 000 | | |

සටහන - 2019.12.31 දිනට ක්‍රීඩා උපකරණවල අගය රු: 25 000 කි.

අවශ්‍ය වන්නේ

2019.12.31 දිනට ගෝල්ඩ් ස්ටාර් ක්‍රීඩා සමාජයේ ආදායම් ප්‍රකාශනය

iii) පහත දැක්වෙන්නේ සනුජගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2019.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමය.

ශේෂ පිරික්සුම

| විස්තරය | රු: | රු: |
|---|---|---|
| 2019.01.01 දිනට ප්‍රාග්ධනය | | 300 000 |
| 2019.01.01 දිනට තොගය | 28 000 | |
| 15% බැංකු ණය | | 100 000 |
| රක්ෂණය | 7 000 | |
| ගැණුම් | 250 000 | |
| විකුණුම් | | 465 000 |
| ණය ගැතියෝ | 15 000 | |
| ණය හිමියෝ | | 10 000 |
| දුන් වට්ටම් | 2 000 | |
| ලද වට්ටම් | | 5 000 |
| ලී බඩු (පිරිවැය) | 20 000 | |
| බෙදාහැරීමේ මෝටර් රථය (පිරිවැයට) | 400 000 | |
| 2019.01.01 දිනට ණය වෙන් කිරීම් | | |
| බෙදා හැරීමේ රථ | | 120 000 |
| බැංකු ණය පොලී | 6 000 | |
| විදුලි ගාස්තු | 15 000 | |
| ගොඩනැගිලි කුලී | 30 000 | |
| මුදල් ශේෂය | 227 000 | |
| | 1000 000 | 1000 000 |

අමතර තොරතුරු

1. 2019.01.01 දිනට තොගය රු: 23 000 කි.
2. ණය ගැතියන්ගෙන් රු: 18 000 ක බොල් ණය ලෙස කපාහැරීම.
3. බෙදා හැරීමේ මෝටර් රථ හා ලී බඩු 10% බැගින් වාර්ෂිකව ක්ෂය කිරීම.

අවශ්‍ය වන්නේ

i) 2019.12.31 දිනට ලාභ හෝ අලාභ ප්‍රකාශනය

ii) 2019.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය